## Abstract No 83

# ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර සංස්කෘත සෙල්ලිපිවලින් හෙළිවන තොරතුරු ගවේෂණයක්

**එච්.එන්. චාමර**
ශාස්ත්‍රවේදී (විශේෂ), තුන් වැනි වසර, සිංහල අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය
chamaranuwan65@gmail.com

ලොව අතීත මානවයාගේ තොරතුරු ගවේෂණය කිරීමෙහිලා ඉතිහාසඥයන් සහ පුරාවිද්‍යාඥයන් පදනම් කර ගන්නා සාධක අතර ශිලාලේඛන ප්‍රමුඛස්ථානයක් හිමි කරගනී. ශිලාලේඛන කෙරෙහි පදනම් වූයේ එම සංස්කෘතීන්ගේ අනන්‍ය වූ අක්‍ෂර රටා සමුදායන් ය. ශ්‍රී ලංකාවේ ද පුරාණ අක්‍ෂර සමුදායකින් රචිත සෙල්ලිපි බොහෝ හමු වේ. ඒ අතුරින් උතුරු නැගෙනහිර සංස්කෘත සෙල්ලිපිවලට වඩා වැඩි වැදගත් කමක් හිමි වෙයි. කච්චතිව් , කුච්චවේලි , තිරියාය ආදි සංස්කෘත සෙල්ලිපිවලින් තත්කාලීන ශ්‍රී ලාංකේය ජනසමාජයේ ආර්ථික දේශපාලන සංස්කෘතික හා සමාජීය තොරතුරුවලට ප්‍රමුඛතාවක් හිමි වේ. වර්තමාන පර්යේෂකයන් උතුරු නැගෙනහිර සංස්කෘත සෙල්ලිපිවලින් හෙළිවන සමාජ ආර්ථික තොරතුරු ගවේෂණය කිරීම පසුගාමී තත්ත්වයක පවතින බැවින් ඒ පිළිබඳ ව විමර්ශනාත්මක අධ්‍යයනයක යෙදීම මාගේ පර්යේෂණ කාර්ය යි. ප්‍රාථමික මූලාශ්‍රය සහ ද්විතීයික මූලාශ්‍රය ඇසුරු කර ගැනෙන අතර ප්‍රාථමික මූලාශ්‍රයන්හි දැක්වෙන කරුණු සනාථ කර ගැනීමේ දී ද්විතීයික මූලාශ්‍රය හා ඒ පිළිබඳ ව අදහස් දක්වන උගතුන්ගේ මතවාද සැලකිල්ලට ගැණේ. ඒ අනුව සාධක සහිත ව නිශ්චය කළ හැකි මතවාදය/මතවාද ශාස්ත්‍රීය ව සාකච්ඡාවට ලක් කිරීමට අපේක්ෂා කෙරේ.

**ප්‍රමුඛ පද :-** සංස්කෘත සෙල්ලිපි , උතුරු නැගෙනහිර , මතවාද , ගවේෂණය